**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**වළිමණ්ඩලවියල් තිණෛක්කළම්**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **06** WW/O/22/12/08/03
වර්ණය : ඇම්බර්

## “මැන්ඩවුස්” සුළි කුණාටුව පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 දෙසැම්බර් මස 08 දින ප.ව.07.00 තෙක් වලංගු වන පරිදි
2022 දෙසැම්බර් මස 08 දින ප.ව.04.00 ට නිකුත් කරන ලදී.

**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සහ ගිනිකොණ දිග සහ නිරිතදිග බෙංගාල බොක්ක සඳහා**


**සැලකිලිමත් වන්න!**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ (ත්‍රිකුණාමලය සිට කි.මී. 280ක් පමණ නැගෙනහිර දෙසින්) ස්ථාපිත වී පවතින “මැන්ඩවුස්” සුළි කුණාටුව පෙ.ව. 11.30 වන විට අක්ෂාංශ 9.7N සහ දේශාංශ 83.5E ආසන්නයේ ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය බටහිරට බරව වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 09 දින උදෑසන චණ්ඩ සුළි කුණාටුවක් බවට පත් වී දෙසැම්බර් 09 රාත්‍රී කාලය වන විට නිරිත දිග බෙංගාල බොක්ක හරහා උතුරු තමිල්නාඩු, පුදුචේරි සහ දකුණු ආන්ද්‍ර ප්‍රදේශ් වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

උතුරු අක්ෂාංශ 05ත් 15ත් සහ නැගෙනහිර දේශාංශ 80ත් සහ 88ත් අතර මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය උපරිම වශයෙන් පැ.කි.මී. (70-90) පමණ වන අතර විටින් විට පැ.කි.මී. 100 දක්වා වැඩිවිය හැක. මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු හෝ දළ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

කන්කසන්තුරය සිට මුලතිවු හරහා ත්‍රිකුණාමලය දක්වා ප්‍රදේශවල මුහුදු රළ මීටර් 2.5-3.5 ක් පමණ (මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාවක් පවතී. මේ හේතුවෙන් ඉහතින් දක්වා ඇති ප්‍රදේශවල මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.

සුළි කුණාටුවේ අපේක්ෂිත ගමන් මාර්ගය **(Source: RSMC India)**




වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

පද්ධතියේ ගමන් මාර්ගය පිළිබඳ අනාවැකිය

| දිනය/ වේලාව (පැය) | පිහිටීම ( අක්ෂාංශ/ දේශාංශ) | උපරිම සුළං වේගය ( පැ.කි.මී) | වර්ගය |
|---|---|---|---|
| 08.12.22/17.30 | 10.2/82.9 | 85-95, 105 දක්වා වැඩි විය හැක | චන්ඩ සුළි කුණාටුව |
| 08.12.22/23.30 | 10.7/82.3 | 85-95, 105 දක්වා වැඩි විය හැක | චන්ඩ සුළි කුණාටුව |
| 09.12.22/05.30 | 11.2/81.7 | 80-90, 100 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 09.12.22/11.30 | 11.6/81.2 | 75-85, 95 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 09.12.22/23.30 | 12.3/80.3 | 70-80, 90 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 10.12.22/11.30 | 12.7/79.7 | 45-55, 65 දක්වා වැඩි විය හැක | පීඩන අවපාතය |

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **මන්නාරම සිට කන්කසන්තුරය ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වලට සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ වලට (05N - 15N, 80E – 88E), නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

***පද්ධතිය අඛණ්ඩ නිරීක්ෂණ යටතේ පවතින අතර මීළඟ පණිවිඩය හෙට, 2022 දෙසැම්බර් 08 ප.ව. 07.00 ට නිකුත් කෙරේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **06** WW/O/22/12/08/03
COLOR: **Amber**

# Advisory for Cyclonic storm "Mandous".

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 04.00 p.m. 08 December 2022, valid until 07.00 p.m. 08 December 2022

**For deep and shallow sea areas from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa and Southeast & Southwest Bay of Bengal.**


**PLEASE BE AWARE!**

**The cyclonic storm "Mandous" over Southwest Bay of Bengal (280km east of Trincomalee) located near latitude 9.7N and longitude 83.5E at 11.30 a.m. today. It is very likely to move west-northwestwards and further intensify into a Severe Cyclonic Storm in the morning of 09th December and cross North Tamil-Nadu, Puducherry and South Andhra Pradesh coast over Southwest Bay of Bengal around mid-night of 09th December.**

Maximum wind speeds will be (70-90) kmph and can increase up to 100 kmph in sea areas between (05N - 15N) and (80E – 88E). Heavy showers or thundershowers and very rough to high seas can be expected in aforementioned sea areas.

There is a possibility that near-shore sea areas off the coast extending from Kankasanturai to Trincomalee via Mullaitivu may experience surges due to swell waves of (about 2.5 m – 3.5 m) height (This is not for land area).

**Expected path of the cyclone (Source: RSMC-India)**



TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**The forecast track and intensity of the system are given in the following table**

| Date/Time (SLST) (Hrs) | Position (Lat. °N/ Long. °E) | Maximum wind speed (Kmph) | Category of cyclonic disturbance |
|---|---|---|---|
| 08.12.22/17.30 | 10.2/82.9 | 85-95 gusting to 105 | Severe Cyclonic Storm |
| 08.12.22/23.30 | 10.7/82.3 | 85-95 gusting to 105 | Severe Cyclonic Storm |
| 09.12.22/05.30 | 11.2/81.7 | 80-90 gusting to 100 | Cyclonic Storm |
| 09.12.22/11.30 | 11.6/81.2 | 75-85 gusting to 95 | Cyclonic Storm |
| 09.12.22/23.30 | 12.3/80.3 | 70-80 gusting to 90 | Cyclonic Storm |
| 10.12.22/11.30 | 12.7/79.7 | 45-55 gusting to 65 | Depression |

**Actions Required:**

- **Naval and fishing communities are advised not to venture into the deep and shallow sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa and Southwest Bay of Bengal (05N - 15N, 80E – 88E) until further notice.**

- **Those who are out at aforementioned sea regions are advised to return to coasts or moved safer areas immediately.**

- **Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

***The system is under continuous surveillance and the next message will be issued at 07.00 p.m. today, the 8th Dec, 2022.